රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1984 අප්‍රේල් මස 05 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය.

## ජීවන වියදම් දීමනාව.

මාස හයකට පසුව සමාලෝචනය කිරීමට නියමිත වූ, රු:246/= මාසික ජීවන වියදම් දීමනාව ගෙවීම අනුමත කරන ලද 1983.09.15 දින හා අංක 411 දරණ ආයතන චක්‍රලේඛය සැබැඳේ.

02. සමාලෝචනයෙන් පසු 1984 පෙබරවාරි මාසයේ ජීවන වියදම් දර්ශකය මත, ගෙවිය යුතු අතිරේක මුදල මසකට රු:102/=කි. මාසික රු:246/= ට වැඩිමනත් වන්නාවූ ජීවන වියදම් දීමනාවේ වැඩිවීම 1984 මාර්තු මස 01 දින සිට පහත සඳහන් පරිදි ගෙවිය යුතුය.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව ගෙවීමට නියමිත රාජ්‍ය අංශය, බැංකුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පෞද්ගලික අංශයේ තම කලත්‍රයා සේවයෙහි යෙදී නොමැති විවාහක රජයේ නිලධරයෙකුට. | ජීවන වියදම් දීමනාවේ වැඩිවීම සම්පූර්ණයෙන් ගෙවිය යුතුය. (එනම් මසකට රු:102/=කි.) |
| (ආ) | වැන්දඹුව සහ වැන්දඹු පුරුෂයා | ජීවන වියදම් දීමනාවේ වැඩිවීම සම්පූර්ණයෙන් ගෙවිය යුතුය. (එනම් මසකට රු:102/=කි.) |
| (ඇ) | අවිවාහක පුරුෂයා/අවිවාහක ස්ත්‍රිය | ජීවන වියදම් දීමනාවේ වැඩිවීමෙන් අඩක් ගෙවිය යුතුය. (එනම් මසකට රු:51/=කි.) |
| (ඈ) | ජීවන වියදම් දීමනාව ගෙවන රාජ්‍ය අංශය, බැංකුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පෞද්ගලික අංශයේ තම කලත්‍රයා සේවයෙහි යෙදී සිටින විවාහක රජයේ නිලධරයකුට. | ජීවන වියදම් දීමනාවේ වැඩිවීමෙන් අඩක් ගෙවිය යුතුය. (එනම් එක් අයෙකුට මසකට රු:51/=කි.) |

03. ජීවන වියදම් දීමනාවේ සම්පූර්ණ වැඩිවීම වූ මසකට රු:102/= (නැවත සේවයේ යොදවන ලද විශ්‍රාමිකයෙකු හැර) වැන්දඹු හා අනන්දරු විශ්‍රාමිකයින් ඇතුළු සෑම විශ්‍රාමිකයෙකුටම ගෙවිය යුතුය.

04. ජීවන වියදම් දීමනාව ගෙවනු ලබන රාජ්‍ය අංශය, බැංකුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පෞද්ගලික අංශයේ තම කලත්‍රයා සේවයේ යෙදී සිටින විට නැවත සේවයේ යොදවන ලද විශ්‍රාමිකයෙකුට ගෙවිය හැකි වන්නේ ජීවන වියදම් දීමනාවේ වැඩිවීමෙන් අඩක් පමණකි.

............../2

05. රජයේ නිලධරයෙකුගේ කලත්‍රයා, නැවත සේවයේ යොදවා ඇති විශ්‍රාමිකයෙකු නොවන අවස්ථාවකදී රජයේ නිලධරයාට ජීවන වියදම් දීමනාවේ වැඩිවීම සම්පූර්ණයෙන් ගෙවිය යුතුය.

06. ජීවන වියදම් දීමනාවේ වැඩිවීම සම්පූර්ණයෙන් හෝ අඩක් හෝ ගෙවීමට පෙර, ගෙවුම් බලධාරියා විසින් මෙයට යා කොට ඇති ප්‍රකාශනය, රජයේ නිලධරයෙකුගෙන් ලබාගත යුතුය.

07. දැනටමත් ඇස්තමේන්තුගතකර ඇති අරමුදල් වලින්, සොයාර්තමේන්තු ප්‍රධානීන් මෙම ගෙවීම් කළ යුතු අතර, අවශ්‍ය වන්නේ නම් අතිරේක වෙන්කිරීම් භාණ්ඩාගාරයේ මිනුම් හා ගෙවීම් අධ්‍යක්ෂ ගෙන් ලබාගත යුතුය.

08. තත්ත්වය මාස 6 කින් පසුව නැවත සමාලෝචනය කරනු ලැබේ.

09. මෙම චක්‍රලේඛය නිකුත් කරන්නේ භාණ්ඩාගාරයේ ලේකම් වරයාගේ එකඟතාවය ඇතිවය.

(අත්සන)
ආයතන අධ්‍යක්ෂ.

<u>ඇමුණුම.</u>

1984.04.05 දිනැති අංක: 247 දරණ රාජ්‍ය පරිපාලන
චක්‍රලේඛය ප්‍රකාර කරනු ලබන ප්‍රකාශනය

........................................................................ වන මම
(නම)

........................................................................
(පදවිය)

පහත සඳහන් පරිදි ප්‍රකාශ කරමි.

(I) මම අවිවාහකයෙක්මි.*

(II) මම විවාහකයෙක්මි. මගේ කලත්‍රයා රැකියාවක් නොකරයි.*

(III) මම විවාහකයෙක්මි. මගේ කලත්‍රයා රාජ්‍ය අංශයට*/ බැංකුවකට*/ රාජ්‍ය සංස්ථාවකට*/ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට*/ පෞද්ගලික අංශයට* අයත් .............. හි සේවයෙහි යෙදී සිටී. එහි ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.* / නොගෙවනු ලැබේ.*

(IV) මම වැන්දඹුවක් වෙමි.*/ වැන්දඹු පුරුෂයෙක් වෙමි.*

(V) මම නැවත සේවයේ යොදවා ලද විශ්‍රාමිකයෙක් වෙමි.*

(VI) ජීවන වියදම් දීමනාවේ වැඩිවීම ගෙවීමට බලපාන යම්කිසි වෙනසක් ඇති වුවහොත් එම වෙනස්වීම සිදුවූ වහාම ගෙවීම් නිලධරයා වෙත දැන්වීමට පොරොන්දු වෙමි.

..............................................
( අත්සන )

..............................................
( දිනය )

* අනවශ්‍ය තැන් කපා හරින්න.

තු/05